# සබරගමු පළාත් අධ්‍යාපන දෙපාතර්‍මේන්තුව

## ජූලි 03 වන සතිය - බුද්ධ ධර්මය - 4 ශ්‍රේණිය

සැකසුම - එම්.වී.සම්පත් බන්ධු ගුණසේකර - ර/බළ/වෙළඟපොළ විද්‍යාලය

**පුංචි දුවේ පුතේ, අම්මට හරි තාත්තට හරි මේ ප්‍රශ්න ටික අහන්න කියන්න.ඔයගොල්ලො උත්තර දෙන්න.**

1. ගේ දොර පිළිවෙළකට තබා ගැනීමෙන් අපට ලැබෙන වාසි තුනක් කියන්න.
2. ගේ දොර පිළිවෙළකට තබා ගැනීමට අපට කළ හැකි දේවල් තුනක් කියන්න.
3. ඕකාස අහං භන්තේ තිසරණේන සද්ධිං යන ගාථාව කියන්න.
4. පාසල් සිසුවෙකු සතු හොඳ ගුණාංග මොනවාද?
5. මෛත්‍රී භාවනාවට සූදානම් වන අයුරු විස්තර කරන්න.
6. අනුග්‍රහ බුද්ධියෙන් දන් දිය හැකි අවස්ථා පහක් කියන්න.
7. පරිසරය අලංකරණයට ඔබට කළ හැකි දේ කියන්න.
8. පිරිත් මණ්ඩපය සාදන ආකරය විස්තර කරන්න.
9. පිරිත් මණ්ඩපය ඇතුළත තැන්පත් කරන දේ මොනවාද?
10. අපේ සිත අපිරිසිදු වූ විට සිදුවන දේ මොනවාද?

**දැන් අපි මේවට උත්තර ලියමු දුවේ පුතේ,**

- පහත සඳහන් වැකි හරි නම් (√) ලකුණ ද වැරදි නම් (x) ලකුණ ද වරහන් තුළ යොදන්න.

1. පිරිත් මණ්ඩපය තුළ සංඝ රත්නය සංකේතවත් වන්නේ ධාතු කරඬුවෙනි ( )
2. හොඳ මිතුරන් සැමවිටම අපව විපතට පත් කරයි. ( )
3. මහප්‍රජාපතී ගෝතමී දේවියගේ පුතා ආනන්ද විය. ( )
4. යේ ධම්මා හේතුප්පභවා යන ගාථාවේ පද දෙකක් ඇසූ පමණින් ම උපතිස්ස පිරිවැජි රහත් විය. ( )
5. උපන් දිනයට සාදයක් පැවැත්වීම යහපත් බොදු සිරිතකි. ( )

- හිස්තැනට ගැළපෙන නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

1. පිරිත් නූල් බඳිනු ලබන්නේ ................................ අතේය. (වම්/දකුණු)
2. බැ හාමුදුරුවො අපිත් දකින්නැති ගීතය ගායනා කරන්නේ ............. මහතාය. (සුනිල්

- හිස්තැනට ගැළපෙන නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

3. කාන්තාවන්ට බුදු සසුනේ පැවිද්ද හිමි වූයේ ................ දී ය. (න්‍යග්‍රෝධාරාමයේ/කූටාගාර ශාලාවේ)
4. විහාරස්ථානයේ දී මුලින්ම වන්දනා කළයුතු වන්නේ ................ ය. (බෝධි මළුව/සෑ මළුව)
5. ප්‍රමාණවත් තරම් ආහාර බෙදා ගැනීම ................ පුරුද්දකි. (යහපත් / අයහපත් )

**සෑම දෙනාම පරිස්සමට ගෙදර ඉන්න. බුදු සරණයි !**